**ඉරක්කාමම් ප්‍රාදේශීය සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**

**-------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
**------------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
**----------------------------------**

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 24 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, 2016 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 සැප්තැම්බර් 29 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
**-----------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ඉරක්කාමම් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
**-------------------------------------**

#### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
**----------------------**

ගිණුම් පිළියෙල කිරීම සඳහා අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කර නොතිබුණි.

#### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
**-------------------------**

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) එක්සත් ජාතීන්ගේ සංවර්ධන ව්‍යාපෘති (UNDP) යටතේ ඉදිකර 2016 පෙබරවාරි 17 දින සභාව වෙත භාර දෙනු ලැබූ පොදු වෙළඳපොල ගොඩනැගිල්ලේ වටිනාකම වන රු.4,799,500 ක් ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ආ) පැරණි කාර්යාල ගොඩනැගිල්ල සම්පූර්ණයෙන් කඩා ඉවත් කර එම ස්ථානයේ පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය විසින් රු.මිලියන 10 ක වියදමෙන් නව කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකර 2011 වර්ෂයේදී භාරදී තිබූ නමුත් එම ගොඩනැගිල්ලේ වටිනාකම්වල වෙනස්වීම ගිණුම්වල ගලපා නොතිබුණි.

**1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම**

මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති පහත සඳහන් එක් එක් කරුණුවලට අදාළව ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| ගොඩනැගිලි | 3,476,675 | ස්ථාවර වත්කම් ලේඛනය |
| ලැබිය යුතු මස්කඩ බදු කුලී | 535,277 | ශේෂ සනාථ කිරීමේ ලිපි සහ හිඟ ශේෂ පිළිබඳ විස්තර |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵලය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු.1,637,187 ක පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායමක් විය. එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,612,179 ක් ව තිබූ හෙයින් මූල්‍ය ප්‍රතිඵලයේ රු.974,992 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි.

**2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ කුලී, බලපත්‍ර ගාස්තු, වෙනත් ආදායම් සියයට 12 සිට සියයට 65 ක් දක්වා පරාසයකින් වැඩි වී හා රජයේ බදු සහනාධාර සියයට 10 කින් අඩු වී තිබූ බව දක්නට ලැබුණි.

**2.3 ආදායම් පරිපාලනය**

**2.3.1 වරිපනම් හා බදු**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් ව්‍යාපාරික ස්ථාන 368 ක් සහ නිවාස 4,673 ක් මත 2010 වර්ෂයේ සිට වරිපනම් ගාස්තු තක්සේරු කර අයකර ගැනීමට කටයුතු කර නොතිබීමෙන් වාර්ෂිකව ආසන්න වශයෙන් රු.2,520,500 ක ආදායමක් අහිමි වෙමින් පැවතුණි.

**2.3.2 මස් කඩ බදු මුදල් අයකිරීම**

2003 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ හිඟ හිටව පැවති මස් කඩ බදු මුදල් රු.1,029,223 ක් මේ දක්වා අයකර ගෙන නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) එකතුව රු.291,339 ක් වටිනා වර්ෂ 02 කට වැඩි කල් ඉකුත් වූ තැන්පතු 17 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව අදාළ පුද්ගලයින්ට ආපසු ලබාදීමට හෝ ආදායම් ගිණුමට මාරු කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ආ) කාර්යාල ගොඩනැගිල්ල, මහජන පුස්තකාලය, පොදු වෙළඳපොළ, මහජන ක්‍රීඩාංගනය සහ සත්ව ඝාතකාගාරය යනාදිය පිහිටි ඉඩම් 06 ක අයිතිය සභාවේ නමට මාරුකිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

### 3.2 නිෂ්කාර්ය වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පළාත් සභාවට වෙන්කරනු ලැබූ සංවර්ධන සහනාධාර යටතේ 2015 වර්ෂයේ රු.1,338,328 ක පිරිවැයකින් ඉදිකරනු ලැබූ සතුන් ඝාතනය කිරීමේ ඝාතකාගාරය සුසාන භූමියට සමීපව ඉදිකර තිබූ බැවින් මහජනතාවගේ විරෝධය හේතුවෙන් මේ දක්වා ප්‍රයෝජනයට ගත නොහැකිව තිබුණි.

(ආ) පළාත් සභාවට වෙන්කරනු ලැබූ සංවර්ධන සහනාධාර යටතේ 2016 වර්ෂයේ රු.997,147 ක පිරිවැයකින් ඉදිකරනු ලැබූ ඝන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයට අවශ්‍ය යන්ත්‍රෝපකරණ සවිනොකිරීම නිසා මේ දක්වා භාවිතයට ගත නොහැකි වීමෙන් නිෂ්කාර්යව පැවතුණි.

## 4. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

| | පාලන ක්ෂේත්‍රය | විශේෂ අවධානය යොමුකළ යුතු කරුණු |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් පාලනය | ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා ගැනීම. |
| (ආ) | ආදායම් අයකිරීම කළමනාකරණය | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කිරීම. |